# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1761/21 – 2012 ජුනි 08 වැනි සිකුරාදා – 2012.06.08**

**(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/15/35/2009.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 හා 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2011.06.10 වන දින අංක 1709/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2011.06.03 වැනි දින දරන නියෝගයෙන්

එක් පාර්ශවයක් වශයෙන් :

මාග්‍රට් වෛද්‍යරත්න මිය, අංක 207/4, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, මහර, කඩවත.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර පවත්නා 2011.05.24 දින දරන කාර්මික ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සුනිල් ගුණරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම, එම නියෝගය අවලංගු කරන අතර එකී 2011.06.03 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

06 — 833/1

1A – G 016164 – 385 (2012/06)

මගේ අංකය: IR/15/35/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන් :

මාග්‍රට් වෛද්‍යරත්න මිය, අංක 207/4, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, මහර, කඩවත.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

පිලියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30හි සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/35/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන් :

මාග්‍රට් වෛද්‍යරත්න මිය, අංක 207/4, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, මහර, කඩවත.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 1999.07.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරෙහි වැඩබැලීම සඳහා පත් කරනු ලැබූ මාග්‍රට් වෛද්‍යරත්න මහත්මිය එම දින සිට ක්‍රියාත්මක වන පරිදි එකී තනතුරෙහි ස්ථිරත්වය ලබාදී ඒ අනුව හිඟ වැටුප් හා දීමනා ලබාදෙන ලෙසට ඇය විසින් කරන ඉල්ලීම යුක්තිසහගතද යන්න හා යුක්ති සහගත වන්නේ නම්, ඇයට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 මාර්තු මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

06 - 833/2

මගේ අංකය: IR/10/37/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන් :

ඩබ්ලිව්. පී. ටී. රෝහණ සිල්වා මයා, අංක 128බී, උඩුම්බුගොඩ, වරාපිටිය, ධර්ගා නගරය.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

කලම්බු කොමියුනිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 58, ධර්මපාල මාවත, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, නො. 213 හි එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/10/37/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන් :

ඩබ්ලිව්. පී. ටී. රෝහණ සිල්වා මයා, අංක 128බී, උඩුම්බුගොඩ, වරාපිටිය, ධර්ගා නගරය.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

කලම්බු කොමියුනිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 58, ධර්මපාල මාවත, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

කලම්බු කොමියුනිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් හි රියදුරෙකු ලෙස සේවය කරන ලද ඩබ්ලිව්. ටී. ටී. රෝහණ සිල්වා මහතාට 2002.08.15 දින සිට 2002.12.31 දින දක්වා සහ 2004.01.01 දින සිට 2004.09.25 දින දක්වා සේවය කළ කාලය තුළ හිමිවිය යුතු අතිකාල සේවා දීමනාව (රු. 1,34,625/-ක මුදලක්) නොගෙවීම යුක්ති සහගත ද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 මාර්තු මස 05 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

06 - 834

මගේ අංකය: IR/10/24/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන් :

ආර්. ඩී. ධනපාල මහතා, අංක 44, ජයතිලක මාවත, හාලිඇල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

වත්තල, හැඳල, නිමල මරියා මාවත, නො. 33/2හි පාලිත වීරසේකර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/24/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන් :

ආර්. ඩී. ධනපාල මහතා, අංක 44, ජයතිලක මාවත, හාලිඇල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කළ ආර්. ඩී. ධනපාල මහතා 2002.07.04 දින පැවැත්වූ ගබඩා භාරකරුවන් පළමු පන්තියට උසස් කිරීමේ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පළමු ශ්‍රේණියේ නොපිහිටුවීමෙන් ඔහුට යම් අගතියක් සිදුවූයේද, එසේ වූයේ නම් කුමන සහනයන් ඔහුට හිමිවිය යුතුද යන්නත් පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 මාර්තු මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

06 - 835

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.